# පාදුවාහී 26වන ශ්‍රීලාංකික ජාතික කිතුණු රැළිය.

සෑම වසරකදී මෙන්ම ශු. ජුසේ මුනි මංගල්‍ය යෙදෙන මැයි මස 01වන දින ජාතික කිතුණු රැළිය ඉතාලියේ වෙසෙන ශ්‍රීලාංකිකයින්ගේ සහභාගිත්වයෙන් පාදුවාහි ශු. අන්තෝනි මුනිඳුන්ගේ බැසිලිකාවේදී මේ වසරේදීත් ඉතා සාර්ථකව පැවැත්විණි. මෙවර 26වන වරටත් පැවැත්වුණු ජාතික කිතුණු රැළිය සඳහා ශ්‍රීලාංකිකයින් පහළොස්දාහකට අධික සංඛ්‍යාවක් සහභාගී විය.

ශු. අන්තෝනි මුනිඳුන්ගේ මැදිහත්වීම තුළ තම ජීවිතවලට ලද අප්‍රමාණ වරප්‍රසාද සඳහා තුති පුදන්නට දහස් ගණනින් යුත් කිතුණු සහා අන්‍යාගමික ජනයා මෙම රැළියට එක්විය.

එදින සිදුකළ විශේෂ තුති පුද දීමේ දිව්‍ය යාගය සිංහල සහ දමිළ යන භාෂා ද්විත්වයෙන්, සෙංකඩගල පදවි එඬේරාණන්වන අති උතුම් වැලන්ස් මෙන්ඩිස් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන්ද, ඉතාලි රදගුරු මණ්ඩලයේ විදේශිකයින් භාරව කටයුතු කරන ජාතික අධ්‍යක්ෂක අතිගරු පිඅර් පාඔලො ෆෙලිකොලො මාහිමිපාණන්ගේද, ඉතාලියේ වෙසෙන ශ්‍රීලාංකිකයින්ගේ ජාතික අපෝස්තලික සම්බන්ධීකාරක අතිගරු නෙවිල් ජෝ පෙරේරා මාහිමිපාණන්ගේ සහා ඉතාලිය පුරා සේවය කරන ශ්‍රීලාංකික පූජකවරුන් 25කට අධික ගණනකගේ සහභාගිත්වයෙන් සිදුකෙරිණි.

ජාතික සම්බන්ධීකාරක පියතුමන්ගේ අධීක්ෂණය යටතේ සෑම වසරකදීම මෙම දිව්‍ය පූජාව සංවිධානය කිරීම ඉතාලියේ ශ්‍රීලාංකික සංසයකට භාරදෙනු ලැබේ. එබැවින් මෙම වසරේදී ගරු ශිරාන් දසා පියතුමා ප්‍රමුඛ ඉතාලියේ ෆ්ලෝරන්ස් නගරයේ ශ්‍රී ලාංකික සංසය විසින් සංවිධානය කළහ.

නැතිවූ සියල්ල නැවත සොයා දීමට පිහිටවන්නාවූ ශු. අන්තෝනි මුනිඳුන් තුළින් ලෞකික දේ පමණක් නොව අපගේ ජීවිත තුළ නැතිවී තිබෙන වටිනා යහපත් දේ නැවත සොයාගන්නට පිහිට අයදින්නටද, අභියෝග සහ පීඩන මැද තම වගකීම අකුරටම ඉෂ්ට කළ ශු. ජුසේ මුනිඳුන් මෙන් අපගේ ජීවිත වලටද එල්ල වන අභියෝග සහ පීඩන හමුවේ දෙවිඳුන් තුළ නොබියව මුහුණ දෙන්නට අවශ්‍ය වරප්‍රසාද අයදින්නටද එදින දේව මෙහෙය අතුරතුර රදගුරු හිමිපාණන් විසින් සැදැහැවත් ජනතාවට දේශනා කරන ලදී. තවද සංස්කෘතික වශයෙන් සහා ආගන්තුක සත්කාරවලින් පොහොසත් ඉතා රමණීය දේශයකට උරුමකම් කියන ශ්‍රී ලංකාව මේ වන විට වසර ගණනාවක් මුළුල්ලේ දේශපාලනික වශයෙන් පිරිහෙමින් විවිධ ආර්ථික අර්බුද මධ්‍යයෙහි මුහුණපා සිටින බැවින් ඒ වෙනුවෙන්ද දෙවිඳුන් යදින ලෙස එදින සහභාගී වූ සැදැහැවත් ජනතාවට උන්වහන්සේ තවදුරටත් පවසන ලදි.

දිව්‍ය යාගයෙන් අනතුරුව අතිගරු නෙවිල් ජෝ මාහිමිපාණන් විසින් ශු. අන්තෝනි මුනිඳුන්ගේ බැසිලිකා පාලක අධ්‍යක්ෂක අතිගරු අන්තෝනියෝ රමිනා පියතුමාටද, බැසිලිකාවේ අන් සියලුම සහෝදර පියතුමන්ලාටද, ශු. අන්තෝනි මුනි කරිතාස් සංවිධානයටද, ඉතාලි රදගුරු මණ්ඩලයටද ශ්‍රී ලංකාව වෙනුවෙන් දැක්වූ අඛණ්ඩ සහයෝගය සඳහා විශේෂ ස්තූතිය පුද කරන ලදී.

පාදුවා ශු. අන්තෝනි මුනිඳුන්ගේ බැසිලිකාවේ පවත්වන මෙම ජාතික කිතුණු රැළිය අතිගරු නෙවිල් ජෝ පෙරේරා පියතුමාගේ සංකල්පයකට අනුව ඉතාලියේ විවිධ ප්‍රදේශවල වෙසෙන සහා සේවය කරන ශ්‍රීලාංකිකයින් එක්රැස් කිරීම අරඹයා ප්‍රථමයෙන් 1998 වසරේ මැයි මස 01වන දින ආරම්භ කරන ලද අතර, මේවන විට අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් ඇතුළු ශ්‍රී ලංකා රදගුරු මණ්ඩලයේද මගපෙන්වීම තුළ අද දක්වා නොකඩවා සංවිධානය කරනු ලබයි.

අවසානකොට කිතුණු රැළිය අවසානයේදී පාදුවාහී “Prato della Valle” උද්‍යානයේදී සතර දෙසින් පැමිණි ශ්‍රීලාංකිකයින් තමන්ගේ නෑ හිත මිතුරන් සමග සතුට සමරමින් විනෝදවී ඉතා සතුටු සිතින් දෙවිඳු වරම් මැද විසිරයති.